ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය
இலங்கை சாரணர் சங்கம்
Sri Lanka Scout Association
Incorporated by Parliamentary Act No. 13 of 1957
Member of the World Organization of Scout Movement

2026.09.30

චක්‍රලේඛ අංක :- 81/ 2026

සියළුම දිසා කොමසාරිස් වරුන් සහ ජාතික පුහුණුකිරීමේ මණ්ඩලයේ සාමාජිකයන් වෙත,

මහත්මයාණෙනි/මහත්මියණි,

ක්‍රියාකාරි බාලදක්ෂ නායකයින් වශයෙන්
ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමයේ සේවය කිරීම වෙනුවෙන් දීර්ඝ සේවා ප්‍රසාදනය ලබා දීම

ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමයේ ප්‍රධාන කොමසාරිස් තුමාගේ උපදෙස් මත ජාතික පුහුණු කිරීමේ මණ්ඩලය මගින්, වසර 05 න් 5 ට අඛණ්ඩ සේවා කාලයක් සමූහ මට්ටමින්, දිසා මට්ටමින්, පළාත් මට්ටමින් සහ ජාතික මට්ටමින් අධිකාරි පත්‍රයක් ලබා ඇති සිඟිති බාලදක්ෂ/පෝතක බාලදක්ෂ/බාලදක්ෂ/මානවක බාලදක්ෂ නායක නායිකාවන් සහ කොමසාරිස්වරුන් වෙත ඔවුන්ගේ සේවයට ගරු කිරීමක් ලෙස මෙම ප්‍රදානයන් ලබා දීමට තීරණය කර ඇත.

මෙම ප්‍රදානයන් සඳහා සුදුසුකම් ලබන බාලදක්ෂ නායක/නායිකාවන් ඔබ දිසාවේ ඇත්නම්, මේ සමඟ යොමු කරන ලද පොදු අයදුම් පත නිසි පරිදි පුරවා සෑම මසකම මුල් සතිය ඇතුලත ජාතික පුහුණු කිරීමේ කොමසාරිස් තුමාට ලැබෙන සේ ලිපිකාරිණී දිලන්ති මහත්මිය වෙත ගෙනවිත් භාර දෙන්න. නැතහොත් ලියාපදිංචි තැපෑලෙන් ජාතික බාලදක්ෂ මුලස්ථානයට යොමු කරන්න.

ඔබ යම් කිසි දීර්ඝ සේව ප්‍රසාදනය ලබා ඇත්නම් ඊලග ප්‍රසාදනය ලබා ගැනීමට අයදුම් කිරීමේදී එම අයදුම් පතේ සඳහන් කළ යුත්තේ එම ප්‍රසාදනය ලබාගත් සහතික පත් අංකය සහ දිනය ඇතුලත් කර එම දිනයෙන් පසු විස්තර පමණක් බව කරුණාවෙන් සලකන්න.

අයදුම් කිරීමේදී බාලදක්ෂ නායකයකු නම් එදිනට වලංගු අධිකාරි පත්‍රයක් හෝ පුහුණු කිරීමේ මණ්ඩලයේ සාමාජිකයෙක් නම් එම වසරට වලංගු සේවා භාරකිරීමේ ලිපියේ ඡායා පිටපතක් අයදුම් පත සමඟ අමුණා තිබිය යුතු ය.

නව පොදු අයදුම් පත මෙම ලිපිය සමඟ ඉදිරිපත් කරමු.

ස්තුතියි.

මෙයට,
බාලදක්ෂ සේවයේ නියුතු,

විශ්‍රාමික කර්නල් පද්මලාල් පෙරේරා
ජාතික පුහුණු කිරීමේ කොමසාරිස්

නීතිඥ මනෝජ් නානායක්කාර
ප්‍රධාන බාලදක්ෂ කොමසාරිස්

Manoj Nanayakkara
(Attorney-at-Law)
Chief Commissioner
Sri Lanka Scout Association
65/9, Sir Chittampalam A Gardiner Mw,
Colombo 02, Sri Lanka

65/9 ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02. ශ්‍රී ලංකා
சேர் சிற்றம்பலம் ஏ காடினர் மாவத்தை, கொழும்பு 02.
Sir Chittampalam A Gardiner Mawatha, Colombo 02, Sri Lanka.
Tel : +94 112 433131 / +94 112 433512
Fax : +94 112 433131
E-mail : slsaheadq@gmail.com
Web : www.scout.lk

ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය
දීර්ඝ සේවා ප්‍රසාදනය අවශ්‍යතා හා සුදුසුකම්

1. දීර්ඝ සේවා ප්‍රසාදනය පිරිනැමෙනුයේ බාලදක්ෂ නායකයකු,ඕනෑම මට්ටමේ කොමසාරිස් වරයකු වශයෙන් වසර 05 සිට වසර 05 න් පහට පක්ෂපාති හා කාර්යක්ෂම සේවාවක් ඉටු කරන ලද සාමාජිකයකුට පමණි. (සිඟිති බාලදක්ෂයකු සිට මානවක බාලදක්ෂයකු දක්වා සිටි කාලය මෙම සේවා කාලයට අදාළ නොවන අතර, එය සේවා වාර්තාවට ඇතුළත් නොකළ යුතුය) මෙම ප්‍රසාදනය පිරිනැමෙනුයේ ලබා ඇති අනෙකුත් ප්‍රදානයන්ට අමතරව ය.

2. සුදුසුකම් ලැබීම සඳහා අවශ්‍ය සේවා කාලය එකම තත්ත්වයේ හෝ අඛණ්ඩව හෝ සේවා කාලයක් විය යුතු නොවූවද, 01 වන ඡේදයේ දක්වා ඇති නිලයන්ගෙන් එකක හෝ වැඩි ගණනක සේවය කරමින් අදාළ සේවා කාලය සම්පූර්ණ වී තිබිය යුතු ය.

3. 01 වන ඡේදයට අදාළව අවශ්‍යතා හා සුදුසුකම් ලබා ඇති අයට මෙම ප්‍රසාදනය ලබා ගත හැකි අතර ඒ සඳහා 04 වන ඡේදයට අනුව නිර්දේශ විය යුතු ය.

4. මේ සඳහා ඉල්ලුම් කිරීමේ දී ALSD/F/2026/01 (Adult Long Service Decoration/Form 2026/1) අයදුම් පත්‍රය භාවිතා කළ යුතු ය. අදාළ සේවා කාලය පක්ෂපාතීව හා කාර්යක්ෂමව සපුරා ඇති

   i. ජාතික බාලදක්ෂ මූලස්ථානයේ නායකයන් සඳහා නි.ප්‍ර.කො./ස.ප්‍ර.කො./ජා.වැ.කො. හා ජාතික පුහුණු කිරීමේ කොමසාරිස්තුමාගේ නිර්දේශය මත ද,

   ii. දිස්ත්‍රික් ශාඛා සංගමයේ නායකයන් සඳහා දිසා කොමසාරිස් සහ දිස්ත්‍රික් විධායක කමිටුව හා ජාතික පුහුණු කිරීමේ කොමසාරිස්තුමාගේ නිර්දේශය මත ද,

   iii. ජාතික පුහුණු කිරීමේ මණ්ඩලයේ සාමාජිකයෙක් නම් පුහුණු කිරීමේ අධ්‍යක්ෂක හා ජාතික පුහුණු කිරීමේ කොමසාරිස්තුමාගේ නිර්දේශය මත ද,

ප්‍රධාන බාලදක්ෂ කොමසාරිස්තුමා විසින් දීර්ඝ සේවා ප්‍රසාදනය ප්‍රදානය කරනු ලැබේ.

ALSD/F/2026/01

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය

.... වසරක වැඩිහිටි දීර්ඝ සේවා ප්‍රසාදනය සඳහා අයදුම් පත

(අයදුම්පත නිවැරදිව සම්පූර්ණ කරන්න. අවශ්‍යතා හා සුදුසුකම් පසු පිටේ දැක්වේ)

01. නිර්දේශිත අයගේ නම : .... මයා /මිය/ මෙනවිය
(භාවිතා කරන නම පැහැදිලිව ලියන්න)

01.01. නම පැහැදිලි ඉංග්‍රිසි අකුරෙන් පුරවන්න (Full Name in English Block letters)

....

02. ලිපිනය ....

....

03. දැනට දරන නිලය :

I. බාලදක්ෂ බලපත්‍ර අංකය සහ දිනය :..

II. සමූහය/දිශාව/ජාතික මූලස්ථානය:...

04. උපන් දිනය:................................ වයස :...............ජා.හැ.පත් අංකය:...

05. බාලදක්ෂ දිසාව :..

06. දුරකථන අංකය:- නිවස............................ ජංගම ....රාජකාරි ....වට්ස්ඇප් ....

07. පෙර ලබා ඇති දීර්ඝ සේවා ප්‍රසාදනය: සහතික පත් අංකය: .... දිනය:...

08. සේවා වාර්තාව (අවශ්‍යතා හා සුදුසුකම් ලේඛණයේ අංක 1 සහ 3 වගන්ති බලන්න)

සේවා ස්ථානය (සමූහය/දිසාව/මූලස්ථානය	හොබවන ලද නිලය	සේවා කාලය සිට	දක්වා	බලපත්‍ර /සේවා භාරකිරීමේ ලිපියේ අංකය	ඉටු කරන ලද සේවා කාලය
				එකතුව	

09. වැඩිහිටි ප්‍රදාන ලබා ඇත්නම් අවසන් වරට ලබාගත් වැඩිහිටි ප්‍රදානය

I. ප්‍රදානය :.. ප්‍රදානය ලද දිනය:...

<u>නිර්දේශ කිරීම</u>

ඉහත නම සඳහන් .... මයා/මිය/මෙනවිය තමා විසින් දරණ ලද නිලයන්හි දී කාර්යක්ෂමව සේවය කර ඇති බවට විශ්වාසය තබා දීර්ඝ සේවා ප්‍රසාදනය ලැබීමට සුදුසු බවට නිර්දේශ කරනු කැමැත්තෙමු.

දිනය:.................................. අත්සන:.. ලේකම් දිසා බාලදක්ෂ සංගමය

දිනය:.................................. අත්සන:.. දිසා කොමසාරිස්/නි.ප්‍ර.කො/ස.ප්‍ර.කො/ජා.වැ.කො

දිනය:.................................. අත්සන:.. ජාතික පුහුණුකිරීමේ කොමසාරිස්

....
ප්‍රධාන බාලදක්ෂ කොමසාරිස් — දිනය:...

<u>කාර්යාලීය ප්‍රයෝජනය සඳහා</u>

ලේඛනගත කළ දිනය ප්‍රසාදනය ප්‍රදානය කළ දිනය යොමු අංකය
අධීක්ෂණයට ලක් කලා

....
ජාතික පුහුණු කිරීමේ කොමසාරිස් — දිනය:...